## දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
## Devi Balika Vidyalaya - Colombo

### පළමු වාර පරීක්ෂණය - 2012
### First Term Test - 2012

### බුද්ධ ධර්මය

9 ශ්‍රේණිය

පැය එකයි

01) යේ ධම්මා හේතුප්පභවා යන ගාථාවෙන් පැහැදිලි වන්නේ,

1. කර්මය හා පුනර්භවය පිළිබඳවයි
2. ත්‍රිලක්ෂණය පිළිබඳවයි
3. හේතුඵල දහම පිළිබඳවයි
4. චතුරාර්ය සත්‍යය පිළිබඳවයි

02) බුදුහිමියන්ගේ අවසන් වස්කාලය ගත වූයේ

1. මගධයේ
2. කොසොල් රට
3. බේලුව ගමේ
4. මගධ රට

03) බුදු දහමේ මූලික ඉගැන්වීම වන්නේ

1. හේතුඵල වාදය
2. ශීලය
3. චතුරාර්ය සත්‍ය
4. මධ්‍යම ප්‍රතිපදාව

04) පටිච්ච සමුප්පාදයේ අංග කීයක් ඇතුලත් ද ?

1. අංග 4
2. අංග 5
3. අංක 8
4. අංක 12

05) 'වණ්ණුපථ' ජාතකයෙන් අපට කියාදෙන්නේ,

1. නොපසුබට උත්සාහයෙන් ක්‍රියාකොට අභියෝග ජයගැනීම
2. ජලය අරපරිස්සමින් පාවිච්චි කිරීම
3. ආහාර ප්‍රමාණවත්ව වැලදීම
4. සත්ව කරුණාව හා අවිහිංසාවාදය

06) සතර සෘද්ධිපාද වලට අයත් නොවන්නේ මින් කුමක්ද ?

1. ඡන්ද
2. චිත්ත
3. විමංසා
4. විනය

07) බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පෑමට ආසන්න මොහොතේ එක් භික්ෂුවක් අන් අයගෙන් ඈත්ව භාවනාවේ යෙදිති. එතුමානන් වන්නේ,

1. ආනන්ද හිමි
2. ධර්මාරාම හිමි
3. මුගලන් හිමි
4. සැරියුත් හිමි

08) බුදුරජානන් වහන්සේට අන්තිම දානය දුන් අය හා මුල් දානය දුන් දෙපලවන්නේ,

1. චුන්දකර්මාර පුත්‍රයා හා සුජාතාව
2. කොසොල් රජු හා සුජාතාව
3. චුන්දකර්මාර පුත්‍රයා හා විශාකාව
4. යසකුල පුත්‍රයා හා සුජාතාව

09) 2600 සම්බුද්ධත්ව ජයන්තිය සැමරුවේ කුමක් නිමිති කොට ගෙනද ?

1. බෝධිසත්වයන් වහන්සේ සම්මා සම්බුද්ධත්වයට පත්ව අවු. 2600 පිරීම නිමිත්තෙන්
2. බෝසතුන් මව් කුසයෙන් බිහි වී අවු 2600 ක් පිරීම නිමිත්තෙන්
3. බෝසතුන් ගිහිගෙයින් නික්මී අවු. 2600 ක් පිරීම නිමිත්තෙන්
4. බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පා අවු. 2600 ක් පිරීම නිමිත්තෙන්

10) විපාක දෙන ආකාරය අනුව කර්මය ප්‍රධාන කොටස් 4 කි. එයට අයත් නොවන්නේ,

1. ගරුක කර්ම 2. ආසන්න කර්ම 3. ජනක කර්ම 4. ආචිණ්න කර්ම

11) මරණාසන්න මොහොතේ බුදුරදුන් දැක සිත පහදවා ගත් අයෙකි.

1. දෙව්දත් 2. චුන්දසූකරික 3. මට්ටකුණ්ඩලී 4. සුනීත

12) සන්තුෂ්ටිකාව යනු වෙන් හැඳින්වෙන්නේ,

1. ලද දෙයින් සතුටුවීම 2. ඉවසීම
3. මසුරුබව 4. තණ්හාව

13) බුදුරජාණන් වහන්සේ සෝපාදිශේෂ නිබ්බානය ලැබුවේ කුමන වයසේදී ද ?

1. අවු 80 2. අවු 45 3. අවු 35 4. අවු 30

14) 'නිබ්බානං පරමං සුඛං' යන ගාථා පාඨයේ අර්ථය වන්නේ,

1. ප්‍රියයන්ගෙන් වෙන්වීම 2. අපේක්ෂිත දෙය නොලැබීම
3. නිවන පරම සැපත බව 4. මරණයට පත්වීම

15) වණ්ණුපථ ජාතකයේ බුදුරජාණන් වහන්සේ නියෝජනය කලේ

1. ගොවි නායකයෙකි 2. වෙළඳ කණ්ඩායම් නායකයෙකි
3. තාපසතුමෙකි 4. වැදි නායකයෙකි

16) 'ව්‍යග්ගපජ්ජ' සූත්‍රයෙන් පෙන්වා දෙන්නේ,

1. මුදල් කොටස් 04 කට බෙදා පරිහරණය කලයුතු බවය 2. ඉවසීමේ ගුණයයි
3. අසරණයන්ට පිහිටවීමයි 4. දැහැමි බවයි

17) බුදු සසුනේ අන්තිම ශ්‍රාවකයා

1. රාහුල තෙරුන්ය 2. මුගලන් තෙරුන්ය
3. නන්ද තෙරුන්ය 4. සුභද්ද තෙරුන්ය

18) බුදුරජානන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය කලේ

1. මකුටබන්ධන නම් ස්ථානයේ 2. කොසොල් රට
3. මගද රට 4. අම්බගාම

19) 'සූකර මද්දව' නම් විශේෂ ආහාරය පූජා කලේ

1. චුන්ද කර්මාර පුත්‍රයා
2. යසකුල පුත්‍රයා
3. සුජාතාව
4. විශාකා සිටුදේවිය

20) බෞද්ධයෙකු විසින් දැක සංවේග උපදවාගත යුතු ස්ථානයක් නොවන්නේ,

1. සිදුහත් උපත සිදුවූ තැන
2. අනුපිය අඹවනය
3. බුදු වූ තැන
4. ප්‍රථම දම් දෙසුම පැවැත්වූ තැන

## 2 - කොටස

* සියලුම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01)
1. කුසල චේතනා කීයද ?
2. ඒ මොනවාද ?

02)
1. විපාක දෙන කාලය අනුව කර්මය කොටස් 4 කි. ඒවා නම් කරන්න.
2. ගරුක කුසල කර්මය හා ගරුක අකුසල කර්ම වලට උදාහරණ දෙන්න.
3. නිවන ලබාගත හැකි ආකාර දෙකක් ලියන්න.
4. විපාක දෙන ආකාරය අනුව කර්මය සතර ආකාරය ඒ මොනවාද ?
5. පංච ආනන්තර්ය කර්ම මොනවාද ?
6. මෙලොවදීම විපාක දෙන කර්ම හඳුන්වන්නේ කුමන නමින්ද ?
7. ආසන්න කර්ම යනු මොනවාද ?
8. සත්වයෙකුට නැවත උපතක් ලබාදීමට ඉදිරිපත් වන කර්මය හඳුන්වන්නේ කුමන නමින්ද ?
9. තෘෂ්ණාව ප්‍රධාන කොටස් 03 කි. ඒ මොනවාද ?
10. අපණ්ණක ජාතකයෙන් ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.
11. සිදුහත් කුමරු බුදුවූයේ කුමන වයසේදී ද ?
    බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පෑවේ කුමන වයසේ දී ද ?
12. සතර ඍද්ධිපාද මොනවාද ?